**කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කරුවලගස්වැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ බදුකුලී උපලේඛනය අනුව රු.212,738ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 23,734ක වැඩිපුර අයවීම් ලෙස දක්වා තිබුණි.

(ආ) තුරු සෙවන කඩ කාමරවල වහල සැකසීම, සාලියවැව බස් නැවතුම්පලේ කඩකාමරවල යකඩ දොරවල් දැමීම සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් වූ වියදම් පිළිවෙලින් රු.1,093,013 ක්, රු.1,192,183 ක් සහ රු.88,541 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) අලුත්ගම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.200,000 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) රඹාවැව ජල සැපයුම ලබාදීමේ කර්මාන්තයේ ඍජු ශ්‍රම පදනම යටතේ සභාව විසින් ඉටුකල වැඩ වෙනුවෙන් ලැබී තිබුණු රු.645,570 ක් ණයහිමියෝ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.20,166,890 ක් වූ ලැබිය යුතු ගිණුම් 07 කින් වර්ෂ 03 කට වඩා වැඩි රු.592,082 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.7,329,199 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 කින් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් තුල නොගෙවා තිබෙන රු.925,009 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 129 (2) (අ) සහ (ඊ) වගන්ති | 595,444 | ප්‍රාදේශීය සභාවට ලැබියයුතු උසාවි දඩ, මුද්දර ගාස්තු හා බදු කුලී විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 65,300 | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු 19 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,366,445 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,490,368 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

(අ). සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු '.000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 5,347 | 3,866 | 3,373 | 1,449 | 1,830 | 3,810 | 3,978 | 956 |
| (ii) කුලී | 3,777 | 1,438 | 1,331 | 227 | 2,559 | 636 | 582 | 124 |
| (iii) බලපත්‍ර ගාස්තු | 468 | 149 | 149 | - | 867 | 491 | 491 | - |
| (iv) වෙනත් ආදායම් | 8,933 | 447 | 447 | - | 5,241 | 5,002 | 5,002 | - |

සටහන: රැස්කළ ආදායම තුල වර්ෂයට බිල්කළ ආදායමෙන් අයකිරීම් සහ පසුගිය වර්ෂවල හිඟහිටි ආදායමෙන් අයකිරීම් ඇතුළත් වේ.

**2.2.2** **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

**--------------------------------------------**

සමාලෝචිත වර්ෂයට බිල්කළ මුළු ආදායම රු.5,901,616 ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති හිඟ ආදායම රු.1,076,375 ක් විය. සමාලෝචිත වර්ෂය තුල සියයට 76 කට සමාන රු.5,301,825 ක ආදායමක් රැස්කර තිබුණි.

**2.2.3** **වරිපනම් හා බදු**

**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ රු.3,867,000 ක් වූ වරිපනම් හා බදු වලින් සියයට 61 කට සමානව රු.3,373,618 ක් පමණක් රැස්කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.956,203 ක් වූ හිඟ හිටි වරිපනම් හා බදුවලින් සියයට 70 කට සමානව රු.668,314 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණි.

**2.2.4** **කුළී**

**------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට බිල්කළ රු.1,438,448ක් වූ කුලීවලින් සියයට 92 කට සමාන රු.1,241,110 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණි.

(ආ ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.124,372 ක් වූ හිඟ හිටි කුලීවලින් සියයට 73 කට සමාන රු.90,672 ක් වර්ෂය තුල රැස්කරගෙන තිබුණි.

**3** **මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1** **කාර්යසාධනය**

**-------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

**---------------------**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 07 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

**(ආ) ප්‍රතිපාදන නොසැලසීම**

**-------------------------**

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු ඇස්තමේන්තු අගය රු.1,155,000ක් වූ කාර්යයන් 08ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා එම කාර්යයන් ඉටු කළ නොහැකි වී තිබුණි.

**(ඇ) අත්හැර දැමූ කර්තව්‍යයන්**

**----------------------------**

වාර්ෂික අයවැය මගින් රු.103,100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු කර්තව්‍යයන් 11 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

2014 නොවැම්බර් රු.1,338,227ක් වැයකර කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණද, 2018 අප්‍රේල් වනවිටත් සභා බලප්‍රදේශයේ කසළ එක් රැස් කර බැහැර කිරීම හැර අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් ආරම්භ කර නොතිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

**--------------------------**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සූදානම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේ මූලික පියවරයන් වශයෙන් පොදු මහජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ආහාර සුරක්ෂිත කිරීම, පරිසර සංරක්ෂණය, අඩු ආදායම්ලාභී ගම්මාන නඟා සිටුවීම සමඟ ජනතාවට ලබාදෙන සේවාවන් කාර්යක්ෂම කිරීමට සුදුසු කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමුකර තිබුණි.

(ii) සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු, අපේක්ෂිත ඉලක්ක සහ ප්‍රගතිය මැනිය හැකි දර්ශක හඳුනාගෙන තිබුණද, වර්ෂය තුල සැමට පිරිසිදු ජලය ලබාදීම, කසළ කළමනාකරණය සහ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම යන අරමුණුගත ඉලක්ක මැනීම සඳහා පාදක දත්ත හඳුනාගෙන නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**-------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රාදේශය තුළ ස්ථාපිත කර තිබුණු දුරකථන කුළුණු 16 ක් වෙනුවෙන් සභාවට ලැබිය යුතු ගාස්තුව රු.66,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල තබ්බෝව සතිපොල ආදායම ලෙස රු.2,100 ක් පමණක් රැස්කර තිබුණු අතර, වයඹ පළාතේ සතිපොල සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2014 වර්ෂයේ රු.10,000,000ක් වැයකර ඉදිකර තිබුණු මෙම සතිපොල 2017 ජූලි මාසයෙන් පසුව ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි.

(ඇ) අස්ථානගත වී තිබුණු රු.45,384 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණය අනුව රු.67,853 ක් වූ අස්ථානගත පුස්තකාල පොත් වටිනාකම අනුමැතියකින් තොරව වත්කම් ගිණුම් වලින් ඉවත්කර තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව අනුව ද්විතීයික හා ප්‍රාථමික ශ්‍රේණි දෙකෙහි පුරප්පාඩු 08 ක් සම්පූර්ණ කරගෙන නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**3.4.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

2014 වර්ෂයේ ඉදිකර තිබුණු රු.6,338,227 ක් වූ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය හා නීලබැම්ම නිවාඩු නිකේතනය වර්ෂ 03 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**3.5 හඳුනාගත් පාඩු**

**-----------------**

සභාවේ කුට්ටිගල් ව්‍යාපෘතිය මගින් රු.137,824 ක් වැයකර නිෂ්පාදනය කර තිබුණු කුට්ටිගල් 8,038 ක් ප්‍රමිතියෙන් තොරවීම හේතුවෙන් සභාවට පාඩු සිදුව තිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**---------------**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

**----------------------**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

රු.4,084,978 ක් වැයකර ඉදිකර තිබුණු සාලියවැව බස්නැවතුම්පල කඩ කාමරවල කණු සහ බිත්ති අතර සම්බන්ධතාවය වෙන්ව තිබීම, එක් කඩ කාමරයක ගෙබිම සිමෙන්ති ස්ථරය ඉරිතලා තිබීම හා පිටුපස බිත්තිවල නියමිත පරිදි තීන්ත ආලේප නොකිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

## 4 . ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිලියෙල කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කාලපරිච්ඡේදයට අදාලව පමණක් අභ්‍යන්තර විගණනයක් සිදුකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ආදායම් කළමනාකරණය | (i) හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම.<br>(ii) ක්ෂේත්‍ර ආදායම් කාර්යාලයට භාර දීමේ දීර්ඝ ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) ණයගැති | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) ණය හිමියෝ | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබීම. |